# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 12,112—1960 අප්‍රේල් 22 වැනි සිකුරාදා—22.4.1960**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1950 අංක 25 දරණ ආහාර පාලන පනත**

**4 (1) වෙනි වගන්තිය යටතේ නියෝගය**

**අංක 147**

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) වෙනි වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව, කවරෙකු විසින් හෝ ආහාර පාලක විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක බලය යටතේ හා එම අවසර පත්‍රයේ ආකාරයට හැර, කිසියම් බැටළුවෙකු හෝ එළුවෙකු මෙ රටට ගෙන්වීම, ආහාර, වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් මොහොට්ටාලගේ ඩිංගිරි බණ්ඩා වන මම මෙම නියෝගයෙන් තහනම් කරමි.

ඇම්. ඩී. බණ්ඩා,
ආහාර, වාණිජ හා වෙළඳ ඇමති.

1960 අප්‍රේල් 22 දින,
කොළඹ දීය.

---

## මිල පාලන දැන්වීම්

**කේ්ශු/අංකය 5/60 දරණ ආහාර මිළ නියෝගය** — **සහල්—තොග සහ සිල්ලර**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් විල්ප්‍රඩ් ප්‍රැන්සිස් ප්‍රදිනාන්දු වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) අංක 11,777 හා 59.6.17 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද අංක කේ්ශු/4/59 හා 5/59 හා 59.6.12 වැනි දින දරණ ආහාර මිළ නියෝගයන් 1960.4.11 වැනි දින සිට මෙයින් අවලංගු කරමි.

(2) ඒ සඳහා මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සහල් තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ 1960.4.11 වැනි දින පටන් මේ උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල අනු පිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය තුළ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සහල් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(4) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය තුළ යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සහල් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සහල් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරණ ලද දැන්වීමක් එකී ස්ථානයයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන සේ තැබිය යුතුබව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරණු ලැබූ කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය තුළ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සහල් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සහල් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍ය විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) වෙළෙඳාමේ ස්වාභාවය, එනම්, වෙළෙඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද, යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවත් නියම කරමි.

(6) තවද, මෙම නියෝගයේ කාය්‍ය‍ා සඳහා—

(අ) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සහල් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකුණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ආ) උප ලේඛනයේ සඳහන් සහල් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ඇ) එසේම " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද,

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම සහල් ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(7) උපලේඛනයේ 1 වැනි වගන්තියේ සඳහන් සහල් යම් ප්‍රමාණයක් විකුණන විට ඒ ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබෙ නම් එහි මිළත් උප ලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1960 අප්‍රේල් මස 19 වැනි දින පස්වරු 3ට කුරුණෑගල දිසාපති කාය්‍ය‍ාලයේ දී අත්සන් කරණ ලදී.

ඩබ්ලිව්. ඇෆ්. ප්‍රදිනාන්දු,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>කොට්ඨාශය | 2 වැනි තීරය<br>නියමිත සහල් ප්‍රමාණය සඳහා බෙදා හරින සහල් වල ශුද්ධ කිරුමෙන් හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>නියමිත සහල් ප්‍රමාණය සඳහා බෙදා හරින සහල් වල ශුද්ධ කිරුමෙන් රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| කුරුණෑගල නාගරික සභා කොට්ඨාශය | 13 69 | 0 13 |
| කුලියාපිටිය පළාත් ආංඩු සභා කොට්ඨාශය | 14 02 | 0 13½ |
| පොල්ගහවෙල උප නගර සභා කොට්ඨාශය | 13 69 | 0 13 |
| ගම් කාය්‍ය‍ා සභා කොට්ඨාශයන් වන— | | |
| අලව්ව | 13 69 | 0 13 |
| බින්ගිරිය | 15 09 | 0 14½ |
| බෝයගනේ | 13 91 | 0 13½ |
| දඹදෙනිය | 14 53 | 0 14 |
| දොඩන්ගස්ලන්ද | 14 42 | 0 13½ |
| දූම්මලසූරිය | 14 64 | 0 14 |
| ගොකරැල්ල | 14 53 | 0 14 |
| හුමන්ගල්ල | 14 92 | 0 14½ |
| හෙට්ටිපොල | 15 03 | 0 14½ |
| හිරිපිටිය | 14 64 | 0 14 |
| හොරම්බාව | 14 70 | 0 13½ |
| කළුගමුව | 14 75 | 0 14 |
| කනෝගම | 14 75 | 0 14 |
| මාකඳුර | 14 81 | 0 14 |
| මුරුතැන්ගේ | 14 30 | 0 13½ |
| නාරම්මල | 14 25 | 0 13½ |
| පන්නල | 14 53 | 0 14 |
| පිදූම | 14 08 | 0 13½ |
| පිලැස්ස | 14 02 | 0 13½ |
| පොල්ගහවෙල | 13 55 | 0 13 |
| පොකුහැර | 13 91 | 0 13½ |
| රම්බොඩගල්ල | 14 47 | 0 14 |
| උඩුබද්දව | 14 36 | 0 13½ |
| වාරියපොල | 14 36 | 0 13½ |
| වැල්ලෑව | 13 97 | 0 13½ |
| වැළඩ | 14 19 | 0 13½ |
| අඹන්පොල | 14 41 | 0 14 |
| බලල්ල | 14 13 | 0 13½ |
| ඇහැටුවැව | 15 03 | 0 15 |
| ගල්ගමුව | 14 53 | 0 14½ |
| මහනන්නේරිය | 15 03 | 0 15 |
| මාහෝ | 14 02 | 0 13½ |
| නිකවැරටිය | 14 64 | 0 14 |
| පොල්පිටිගම | 14 53 | 0 14 |
| තම්බොරොම්බුව | — | 0 14½ |

**අංක කේ. ඊ. 69 දරණ ආහාර මිළ නියෝගය.**

**අතිරේක ආහාර ද්‍රව්‍ය.**

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

**අවලංගු කිරීමේ නියෝගය**

කෑගලු දිසාවේ උප (ආහාර) මිළ පාලක තැන්පත් කන්දයියා සිවප්පිරකාසම් වන මම, 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු අංක 4 දරණ වගන්තියෙන් මාවෙත පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් ආහාර මිළ නියෝගය 1960.4.12 වැනි දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි :—

අංක 12,040 සහ 1960.1.20 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1960.1.16 වැනි දින අංක කේ. ඊ. 66 දරණ " මයිසූර් පරිප්පු " පිළිබඳ ආහාර මිළ නියෝගය.

1960 අප්‍රෙල් මස 19 වැනි දින පෙරවරු 11ට කෑගල්ලේ කච්චේරියේ දී අත්සන් කරන ලදී.

කන්දයියා සිවප්පිරකාසම්,
කෑගලු දිසාවේ උප (ආහාර) මිළ පාලක තැන.

---

**අංක 6 දරණ ආහාර මිළ නියෝගය.**

**මයිසූර් පරිප්පු.**

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

**නියෝගය**

ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක මෙතියස් ස්ටීවන් ක්ලීටස් ගුණවර්ධන වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) වැනි වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලය අනුව—

1960 ජනවාරි මස 25 වැනි දින අංක 12,043 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරණලද 1960 ජනවාරි මස 20 වැනි දින අංක 3 දරණ මයිසූර් පරිප්පු සඳහා ආහාර මිළ නියෝගය මේ දැන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රේල් මස 18 වැනි දින පස්වරු 12.15ට ගාල්ලේ කච්චේරියේ දී අත්සන් කරණ ලදී.

එම්. එස්. සී. ගුණවර්ධන,
ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක.

**ඇම්ඇල්. 1960/5 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය.**

**අතිරේක ආහාර ද්‍රව්‍ය (මසූර් පරිප්පු).**

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

**අවලංගු කිරීමේ නියෝගය**

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් බන්දුල සෝමසිරි ද සිල්වා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව, අංක, 12,045 සහ 1960.1.27 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද, 1960.1.19 වෙනි දිනැති ඇම්ඇල්. 1960/2 වෙනි අංකය දරණ අතිරේක ආහාර ද්‍රව්‍ය (මසූර් පරිප්පු) පිළිබඳ මාගේ ආහාර මිළ නියෝගය මේ දැන් සිට, මේ නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රේල් මස 19 වෙනි දින පස්වරු 3 ට මාතලේ දී අත්සන් කරන ලදී.

බන්දුල ඇස්. ද සිල්වා,
මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.

---

**අංක ජේ/22/1960 දරණ ආහාර මිළ නියෝගය**

**අතිරේක ආහාර ද්‍රව්‍ය (මසූර් පරිප්පු)**

### 1950 අංක 29 දරණ මිල පාලන පනත

යාපන දිස්ත්‍රික්කයේ උප (ආහාර) මිළ පාලක තැන්පත් වෙල්ලයියා නික්කුණානන්දම් වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියේ 3 (2) වැනි වගන්තියෙන් එකී උප (ආහාර) මිළ පාලක තැන කෙරෙහි පැවරී තිබෙන බලතල අනුව, 1960. 1. 29 දින හා අංක 12,048 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1960. 1. 20 වැනි දින ජේ/21/1960 දරණ ආහාර මිළ නියෝගයේ 1 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් මසූර් පරිප්පු පිළිබඳ නියෝගය මේ නියෝගයෙන් අද දින සිට අවලංගු කරමි.

1960 අප්‍රියෙල් 19 දින අ. භා. 3.05 යාපන කච්චේරියේ දී අත්සන් තබන ලදී.

සී. නික්කුණානන්දම්,
යාපන දිස්ත්‍රික්කයේ උප (ආහාර) මිළ පාලක තැන.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.